**සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය - 2017**

**------------------------------------------------------------**

සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 සමාගම පිහිටුවීම හා හිමිකාරීත්වය

-------------------------------------

සීමාසහිත කන්තලේ සීනී කර්මාන්තායතනය 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පිහිටුවා නැවත 2007 අංක 07 දරන සමාගම් පනත යටතේද ලියාපදිංචි කර තිබුණි. මෙය රජයේ පූර්ණ හිමිකාරීත්වය සහිත රාජ්‍ය සමාගමකි.

1.5 අහිතකර මතය සඳහා පදනම

------------------------------

(අ) උක් කර්මාන්තය සඳහා කර්මාන්තායතනයේ ඉඩම් උපරිම අයුරින් භාවිතා කරමින් සීනී නිෂ්පාදනයට අමතරව අතුරු නිෂ්පාදන වශයෙන් එතනෝල්, විදුලිය, කාබනික පොහොර ඇතුළු නිෂ්පාදන සඳහා දායක වීම මෙන්ම උක් ගොවීන් උනන්දු කර ඔවුන්ගේ ආර්ථික මට්ටමත් දියුණු කිරීම යන අරමුණු පෙරදැරි කරගෙන ආරම්භ කරන ලද කන්තලේ සීනී කර්මාන්ත ශාලාව 1993 වර්ෂයේ සිට වසා දමා ඇති බැවින් මෙරට ආර්ථිකයට කිසිදු දායකත්වයක් ලබා දෙනු නොලැබේ. එනමුත් මෙම ආයතනයේ පරිපාලන කටයුතු ඇතුළු වියදම් සඳහා වාර්ෂිකව මහා භාණ්ඩාගාරය විසින් අරමුදල් ලබා දෙන අතර ගතවූ වර්ෂ 3 තුළදී මෙම කර්මාන්ත ශාලාව වෙනුවෙන් රු.මිලියන 46.473 ක මුදලක් මහා භාණ්ඩාගාරය විසින් ලබා දී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 32 වන ඡේදය ප්‍රකාරව වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවත්, ණයගැති ශේෂය තුළ ඇතුළත් වූ රු. 1,823,959 ක ගෙවිය යුතු ශේෂය වෙනම පෙන්නුම් කිරීම වෙනුවට ණයගැති ශේෂයට එරෙහිව හිලව් කර ශුද්ධ අගය ලෙස රු.40,717,134 ක් ලැබිය යුතු හා ඉදිරියට කළ ගෙවීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02 හි 09 ඡේදය ප්‍රකාරව තොග, පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මැනිය යුතු වුවත් දීර්ඝ කාලයක් තිස්සේ පාවිච්චියට නොගත් තොගයක් ගබඩාවේ පැවතියද එම තොගයෙහි ශුද්ධ උපලබ්ධි අගය නොසලකා පිරිවැය රු.47,440,818 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කෙරීගෙන යන වැඩ ගිණුමේ රු. 840,774 ක් දක්වා තිබුණු අතර එය හඳුනාගෙන අදාල ගිණුම්වලට ගැලපීම් කර නොතිබුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දිනට මුදල් පොතෙහි ශේෂය රු.1,036,282 ක් වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මුදල් ශේෂය ලෙස රු. 952,818 ක් දක්වා තිබුණු බැවින් රු.83,464 ක මුදල් ශේෂයක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) පහත සඳහන් විෂයයන්වලට අදාළව ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ------- | ------------- | ------------------------- |
| | රු. | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ | 92,066,653 | ශේෂ සනාථන ලිපි |
| ලැබිය යුතු සහ කලින් ගෙවීම් ශේෂ | 27,611,572 | කාල විශ්ලේෂණය |
| හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ දැක්වෙන ලාභ අලාභ ගැලපුම් | 580,953,293 | ජර්නල් වවුචර් |
| ආරක්ෂක නිලධාරීන් වෙත ගෙවූ අතිකාල දීමනා | 1,484,682 | විස්තරාත්මක ලැයිස්තුව |

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 අභිතකර මතය

----------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය මඟින් නියමකරන පරිදි මම පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු හා පැහැදිලි කිරීම් ප්‍රමාණවත් ලෙස නොලැබුණු අතර සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා නොතිබුණු බවත්,

.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

(අ) 1993 වර්ෂයේ සිට වර්ෂ 25 කට අධික කාලයක සිට රු.40,717,134 ක් නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන වල ලැබිය යුතු හා ඉදිරියට කළ ගෙවීම් ශේෂයක් වශයෙන් දක්වා තිබුණි.

(ආ) ලංකා විදුලි බල මණ්ඩලයට 1988 වර්ෂයේ සිට 2010 මැයි මාසය දක්වා ගෙවිය යුතු රු. 76,352,246 ක මුදල ගෙවීමට කටයුතු නොකර අඛණ්ඩව ගිණුම්වල පෙන්වා තිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවුනු අවස්ථා නිරීක්‍ෂණය විය.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (අ) | මුදල් රෙගුලාසි 754(අ) | සෑම මුදල් වර්ෂයක් අවසානයේ දී බඩු ලේඛන පොත තුලනය කළ යුතු වුවත්, බඩු ලේඛන පොත හා ස්ථාවර වත්කම් ලේඛන තුලනය කර නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 756 | රෙගුලාසි ප්‍රකාරව තොග හා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 1997 වර්ෂයෙන් පසු භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,769,102 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,678,186 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්‍ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,090,916 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම පෙර වර්ෂයට සාපේක්‍ෂව රු.1,678,109 කින් වැඩිවීම හා වෙනත් මෙහෙයුම් ආදායම රු.650,971 කින් අඩුවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කන්තලේ සීනි කර්මාන්ත ශාලාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා SLI Developers (Pvt) Ltd ආයතනය සහ MG Sugars Lanka (Pvt) Ltd ආයතනය සමඟ ශ්‍රී ලංකා රජය 2016 අගෝස්තු 11 දින කොටස්කාර ගිවිසුමක් අත්සන් කර තිබුණි. එම කොටස්කාර ගිවිසුමේ සඳහන් පරිදි ගිවිසුමෙහි ඇති ගිවිසුම් කොන්දේසි සම්බන්ධව නිසි අධ්‍යයනයක් සිදු නොකර කර්මාන්තශාලාවට අයත් යන්ත්‍රෝපකරණ අපහරණය සඳහා ටෙන්ඩර් පටිපාටියක් ආරම්භ කර තිබුණි. එසේ වුවද එම වත්කම්වල අයිතිය සම්බන්ධයෙන් ආයෝජකයා සහ ශ්‍රී ලංකා රජය සමඟ ඇති වූ ආරවුල හේතුවෙන් ආයෝජකයා විසින් ශ්‍රී ලංකා රජයට එරෙහිව නඩු පවරා තිබුණි. කෙසේවුවද ආයෝජකයාට කර්මාන්ත ශාලා පරිශ්‍රය නිදහස් කරදීමට කටයුතු සිදු නොකිරීම නිසා ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය 2018 දෙසැම්බර් 18 දින වනවිටත් සිදුකර නොතිබුණි.

(ආ) 2012 සැප්තැම්බර් 09 දින සිට 2014 අප්‍රේල් 30 දක්වා වූ දින 607 ක් සඳහා සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම වෙත උක් බඳින දම්වැල් 700 ක් කුලී පදනම මත ලබාදීමෙන් අය කර ගත යුතු වූ රු.4,249,000 ක කුලී මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

--------------------------

වාර්ෂික සීනි මෙට්‍රික් ටොන් 16,320 ක්, මොලැෂස් මෙට්‍රික් ටොන් 9,000 ක් හා පරිපාරක ස්ප්‍රීතු ලීටර් මිලියන 3.9 ක නිෂ්පාදන ධාරිතාවයකින් යුතු සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය තාවකාලිකව රජයට පවරා ගෙන තිබූ 1993 සැප්තැම්බර් 01 දින සිට කිසිදු සීනි නිෂ්පාදන කටයුත්තක් සිදු නොවීම හේතුවෙන් ප්‍රදේශයේ ජීවත් වූ දහස් ගණනකට සෘජු හා වක්‍ර රැකියා අහිමි වීම නිසා ඔවුන්ගේ ජන ජීවිතවලට විශාල බලපෑමක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

### 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

1991 වර්ෂයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 125 කට තක්සේරු කරන ලද යන්ත්‍ර උපකරණ කිසිදු නිෂ්පාදන කටයුත්තකට යොදා නොගෙන නිසි නඩත්තු කිරීමක්ද සිදු නොකර ඇති බැවින් වර්තමානය වන විට ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබීම නිසා 2017 වර්ෂයේ දී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 60.246 ට ඉහත වත්කම් යකඩ ලෙස විකිණීමට උපදෙස් ලබා දී තිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

කර්මාන්තශාලාවේ වත්කම්වල ආරක්‍ෂාව වෙනුවෙන් සේවකයින් 33 දෙනෙකු හා කාර්යාල නිලධාරීන් 3දෙනෙකු ලෙස සේවකයින් 36 දෙනෙකු සේවයේ යෙදී සිටින නමුත්, අනුමත කාර්ය මණ්ඩලයක් නොවීය. වර්තමානය වන විට මෙම ආයතනයේ කටයුතු රේඛීය අමාත්‍යාංශයේ අධීක්‍ෂණය යටතේ පාලනය වේ.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වුවත්, ආයතනය විසින් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2018 අගෝස්තු 02 දින දීය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින්වර කර්මාන්තායතනය දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්‍ෂණ |
|---|---|---|
| (අ) | තොග පාලනය | තොග සමීක්ෂණයක් සිදු කර යල්පැන ගිය තොග ඉවත් කිරීමට හෝ කපා හැරීමට කටයුතු නොකිරීම. |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | භෞතික සත්‍යාපනයක් කර අපහරණය කළ යුතු වත්කම් හඳුනාගෙන ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු නොකිරීම. |
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | මානව සම්පත ප්‍රශස්ත හා ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකිරීම. |